පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණ කළමනාකරණ භාරය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපොළ සංකීර්ණ කළමනාකරණ භාරයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, භාරයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාරය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි ඡේද අංක 80 හා 82ට පටහැනිව ඉදිරි මාස 12 තුල ගෙවිය යුතු රු.14,285,712 ක ණය ශේෂය ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි.	එකඟ වේ. ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ලංකා බැංකු ණය ශේෂයට අදාලව මාස 12ක් ඇතුළත ගෙවිය යුතු ණය ශේෂය ජංගම වගකීම් යටතේ සහ මාස 12ට වැඩි ණය ශේෂය ජංගම නොවන වගකීම් යටතේ දැක්වීමට සටහන් කරගතිමි.	ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය වගකීම් ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර වාර්තා කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි ඡේද අංක 69ට පටහැනිව භාරය විසින් සෑම වර්ෂයකම ජනවාරි 01 දිනට වත්කමෙහි වටිනාකම පදනම් කරගෙන ක්ෂය ගණනය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී මිලදීගෙන තිබුණු රු.1,245,967 ක්වූ කාර්යාල උපකරණ ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව භාවිතයට ගත් අවස්ථාවේ සිට ක්ෂය කර නොතිබුණි.	එකඟ වේ. ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය වන්නේ ජනවාරි 01 වන දිනට පැවති වත්කම් වටිනාකම පදනම් කරගෙන සරල මාර්ග පදනම මත ක්ෂය සිදුකිරීමයි. ඉදිරියේදී පැවැත්වෙන 66 වන කළමනාකරණ භාර රැස්වීමට කරුණු ඉදිරිපත් කර ශ්‍රී ලංකා රා.ගි.ප්‍ර. 7 අනුව ක්ෂය කිරීම් කළ හැකි පරිදි ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කිරීමට අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම්දෙමි.	ප්‍රමිත ප්‍රකාරව වත්කම් භාවිතයට ගත් අවස්ථාවේ සිට ක්ෂය කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු රු.1,487,165 ක්වූ ලී බඩු හා සවිකිරීම් සහ කාර්යාලීය උපකරණ තවදුරටත් භාවිතා කරමින් පැවතිය ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ඡේද අංක 92 (ආ) ප්‍රකාරව එම වත්කම්වල දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	එකඟ වේ. දේපල පිරියත උපකරණවල දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශවල හෙලිදරවු කිරීම සඳහා කළමනාකරණ භාර මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ. ඒ අනුව නැවත එම වත්කම් අගයකර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.	ප්‍රමිත ප්‍රකාරව සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන දේපල පිරියත උපකරණවල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 1,051,400 ක් වූ අක්‍රිය සීසීටීවී කැමරා අපහරණය සඳහා ගබඩාවේ තබා තිබුණද එහි පිරිවැය දේපල පිරියත උපකරණ තුල ඇතුලත්ව ඇති බැවින් ඒවායේ ධාරණ අගය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	එකඟ වේ. අක්‍රීයව අපහරණය සඳහා ගබඩාවේ තබා ඇති රු. 1,051,400/- ක් වූ සීසීටීවී කැමරාවලට (Cctv) අදාලව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 ඡේද අංක 92 (ඇ) පරිදි ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරවු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම්දෙමි.	අපහරණය සඳහා තබා ඇති වත්කම්වල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.
(ආ)	2021 වර්ෂයේ මිලට ගන්නා ලද රු.1,436,130 ක් වටිනා රථගාල මෘදුකාංග පද්ධතිය 2022 සිට 2024 වර්ෂය දක්වා ක්ෂය ගණනය කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.287,226 ක් වැඩියෙන් ද ක්ෂය වෙන්කිරීම් හා සමුච්චිත අලාභය රු.861,678 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.	එකඟ වේ. මේ පිළිබඳ ගැලපීම් ජූනි මස 30 දිනට QB පද්ධතිය මගින් සිදුකර එහි මෘදුකාංග පිටපතක් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	නිවැරදිව ක්ෂය ගණනය කර ලාභයට ගැලපීම් කළ යුතුය.
(ඇ)	2023 වර්ෂය තුළ මිලදීගෙන හා ස්ථාපිත කර තිබූ රු.3,006,422 ක් වටිනා ප්‍රාග්ධන ස්වරූපයේ අයිතම 06 ක් දේපල පිරියත සහ උපකරණ ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට, අලුත්වැඩියා සහ නඩත්තු වියදම් ලෙස 2023 වර්ෂය තුළ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා දේපල පිරියත උපකරණ රු.3,006,422 ක් අඩුවෙන්ද සමුච්චිත අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.	එකඟ වේ. වවුචර් අංක 4509න් ගෙවා ඇති රු. 2,894,922/- ක මුදල ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට සටහන් කර ගතිමි. රු. 52,500/-ක් වන විදුලිපංකා සහ රු. 59,000/-ක් වටිනා පරිගණක monitor ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. තවද මෙම නිවැරදි කිරීම් මේ වන විට QB පද්ධතිය මගින් සිදුකරමින් පවතින අතර එහි software පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	ප්‍රාග්ධන වියදම් සහ අයභාර වියදම් පැහැදිලිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන හා ස්ථාපිත කර තිබූ රු.3,576,089 ක් වටිනා ප්‍රාග්ධන ස්වරූපයේ අයිතම 08 ක් දේපල පිරියත සහ උපකරණ ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට, අලුත්වැඩියා සහ නඩත්තු වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත	එකඟ වේ. රු. 6,676,252/-ක මුදල පූර්ව වර්ෂයන්හි **Treatment Plant** යටතේ ණය හිමියන්ට ගෙවීම් ලෙස නිවැරදිව ගිණුම්ගතකර ඇත. රු. 6,676,252 අවලංගු කරන ලද වුවචරයකි. ඊට අදාලව ගෙවීම් සිදුකර නොමැත.	ප්‍රාග්ධන වියදම් සහ අයභාර වියදම් පැහැදිලිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

	වර්ෂයේ ලාභය රු.3,520,477 ක් අඩුවෙන්ද දේපල පිරියත හා උපකරණ රු.3,576,089 ක් අඩුවෙන්ද සමුච්චිත ක්ෂය රු.55,612 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.	රු.1,908,874/- සහ රු. 1,669,465/- ක මුදල ස්ථාවර වත්කම් යටතේ **Treatment Plant** ජලනල පද්ධතිය ලෙස ගිණුම්ගත කිරීමට පියවර ගනිමි. මෙම නිවැරදි කිරීම් මේ වන විට **QB** පද්ධතිය මගින් සිදුකරමින් පවතින අතර එහි **software** පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	
(ඉ)	කළමනාකරණ භාරය විසින් පවත්වාගෙන යනු ලබන එකතුව රු.237,737,841 ක්වූ ස්ථාවර තැන්පතු 3 ක් සඳහා 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය රු.13,742,621 ක් වුවද මූල්‍ය ප්‍රකාශන තුළ එය රු.13,421,991 ක් ලෙස හඳුනාගෙන තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.320,630 ක් අඩුවෙන් දක්වා තිබුණි.	එකඟ වේ. ඊළඟට වර්ෂයේ ගිණුම් ඉදිරිපත්කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කිරීමට සටහන් කර ගනිමි.	නිවැරදි පොලී ආදායම හඳුනාගෙන ගැලපීම් කළ යුතුය.
(ඊ)	වාහන ගාල් කිරීම වෙනුවෙන් ලංකා ධීවර සංස්ථාවෙන් ලැබිය යුතුව තිබූ රු.17,402,781 ක ශේෂය වර්ෂ 08 කට වැඩි කාලයක සිට අයනොවී පැවති අතර අයකර ගැනීමේ හැකියාව සලකා බලා ඒ සඳහා අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.	ලංකා ධීවර සංස්ථාව විසින් ලැබිය යුතු රු. 17,402,281/-ක ශේෂය පියවන ලෙස වරින් වර දක්වා ඇත. නමුත් එහි පවතින අයහපත් මූල්‍ය තත්වය හේතුවෙන් එම ශේෂය අයකර ගැනීමට තවදුරටත් පුමාද වී ඇත.	ධීවර සංස්ථාවෙන් අයවිය යුතු මුදල අයකරගැනීමට කටයුතු කළ යුතු අතර එතෙක් ඒ සඳහා අඩමාණ ණය වෙන්කළ යුතුය.
(උ)	කඩකුලී ණයගැතියන් තුළ ඇතුළත්ව ඇති රු.80,248,447 ක අක්‍රීය ශේෂය වසර ගණනක සිට අයනොවී පැවති අතර එය අයකරගැනීමද අවිනිශ්චිත තත්ත්වයක පවතී. එසේ වුවද ඒ සඳහා අඩමාණ ණය වෙන් කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වේ. කළමනාකරණ භාර රැස්වීමේ දී අනුමැතිය ලබාගෙන අඩමාන ණය සඳහා වෙන් කිරීම සිදුකිරීමට කටයුතු කරමි.	අක්‍රීය ණයගැතියන් හට අඩමාණ නියත වෙන්කිරීමක් ද ඉතිරි ණයගැතියන් හට පොදු අනුපාතයක් යටතේ අඩමාණ ණය වෙන්කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේ පෞද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.2,018,875 ක්වූ රථගාල් ගාස්තුව, ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබීම නිසා වර්ෂයේ ලාභය හා ලැබිය යුතු රථගාල් ආදායම රු.2,018,875 ක් අඩුවෙන් දක්වා තිබුණි.	එකඟ වේ. රථගාල් ආදායම ලැබිය යුතු ආදායම් ලෙස ගැලපීම් කිරීමට කටයුතු කරමි.	කාලච්ඡේදයට අදාළ ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතුය.
(එ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස වෙළඳසැල් හිමියන් 22 දෙනෙකු විසින් ඍජුවම බැංකුව වෙත තැන්පත් කරන ලද රු.987,060 ක්වූ බදු කුලී ආදායම,	එකඟ වේ. පූර්ව වර්ෂ අයිතම ගැලපීම යටතේ නිවැරදි කිරීමට කටයුතු කරමි.	ඍජු බැංකු ප්‍රේෂණ හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

	බදු කුලී ආදායම ලෙස සටහන් නොකර බැංකු සැසඳුමේ හඳුනා නොගත් ලැබීම් ලෙස දක්වා තිබීම නිසා ලාභය සහ බදු කුලී ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.		
(ඒ)	භාරයේ වහළය සූර්ය පැනල් පද්ධතියක් සඳහා බදු දීම වෙනුවෙන් රු.305,064 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායම් සේ හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා ලැබිය යුතු සූර්යය පැනල ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	එකඟ වේ. මේ සම්බන්ධයෙන් නීති නිලධාරියාගෙන් උපදෙස් ලබාගෙන ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරමි.	කාලච්ඡේදයට අදාළ ලැබිය යුතු ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ණයගැති කාල විශ්ලේෂණය අනුව සමාලෝචිත වර්ෂයේ රු.107,264,505ක් වූ ණයගැති ශේෂයෙන් රු.80,248,446.91 ක් හෙවත් සියයට 75 ක ප්‍රමාණයක් වර්ෂ 03 ඉක්මවූ ණයගැති ශේෂයක් වන අතර මෙම කල්ගත වූ ශේෂයන් අයකර ගැනීමට කළමනාකරණ භාරය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	හිඟ මුදල් අයකර ගැනීමට මේ වන විට කමිටුවක් පත්කර ඇති අතර එහි නිර්දේශ ලබාගෙන හිඟ මුදල් අයකර ගැනීම කඩිනමින් සිදුකරමි. මෙහි මූලික පියවර ලෙස කඩ කුලී ගෙවන ලෙස ලියාපදිංචි තැපෑලෙන් කඩිනමින් ඇනුවත් කිරීමට කටයුතු කරමින් සිටී.	කල්ගත වූ ශේෂයන් අයකර ගැනීමට කළමනාකරණ භාරය ක්‍රියාමාර්ග ගත යුතුය.

1.6.1 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (CECB) සඳහා ගෙවිය යුතු රු.6,964,161 ක් හා පෞද්ගලික ආයතනයක් වෙත ගෙවිය යුතු එකතුව රු.7,538,491 ක් 2021 වර්ෂයේ සිට පැවත එන ශේෂයන් වූ අතර එම වටිනාකම් සමාලෝචිත වර්ෂයේ දී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වේ. මධ්‍යම ඉංජිනේරු උප කාර්යාලය (CECB) මගින් ඉදිරිපත් කළ යුතු ලේඛනවල පැවති අඩුපාඩු හේතුවෙන් හිඟ රු. 6,964,161/- ක මුදල ගෙවීමට ප්‍රමාද වූ අතර, එම ලේඛන ඉදිරිපත් කිරීමට හා එම මුදල ගෙවීමට කටයුතු කරමි. Centuria IT ආයතනය මගින් සිදුකරන ලද කාර්යයන්හි අඩුපාඩු සකස් කරන තුරු මෙම ගෙවීම් තවදුරටත් ප්‍රමාද කිරීමට සිදුව ඇත.	ගෙවිය යුතු ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති 01/2020 චක්‍රලේඛය මඟින් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසිය 876(3) ඡේදය	ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු අතර අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් පාර්ලිමේන්තු පනතක් මඟින් එම අරමුදල නීතිගත කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	එකඟ වේ. ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පවත්වාගෙන යාම සඳහා මේ වන විට කෙටුම්පතක් සකස් කර නීතිපති වෙත යැවීමට, නළමනාකරණ සභාවේ අනුමැතිය ලබාගැනීමට 66 වන කළමනාකරණ භාර රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.	පාර්ලිමේන්තු පනතක් මඟින් එම අරමුදල නීතිගත කළ යුතුය.
(ආ)	2010 අගොස්තු 10 දිනැති භාර ඔප්පුව			
	(i) වගන්ති අංක 6 (අ) 1	භාරයේ සියලුම අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල, ආණ්ඩුවේ සුරැකුම්පත්වල හැර වෙනත් යම් ආකාරයකින් ආයෝජනය කිරීමට භාණ්ඩාගාරයේ පූර්ව ලිඛිත එකඟතාවයක් ලබාගත යුතු වුවත් එවැනි එකඟතාවයක් නොමැතිව භාරකාර මණ්ඩලයේ තීරණයන් මත එකතුව රු.248,640,220 ක මුදලක් රාජ්‍ය බැංකු දෙකක ස්ථීර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.	එකඟ වේ. මෙම ස්ථාවර ගාස්තු රාජ්‍ය බැංකුවල පමණක් පවත්වාගෙන යන අතර, මින් ඉදිරියට සිදුකරන නව ස්ථාවර ගාස්තු සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමි.	යම් ආකාරයකින් ආයෝජනය කිරීමට ප්‍රථමයෙන් භාණ්ඩාගාරයේ ලිඛිත අවසරය ලබාගත යුතුය.
	(ii) වගන්ති අංක 7 (ඇ)	සංකීර්ණය තුළ මසුන් හැසිරවීම සෞඛ්‍යානුකූලව සිදුකිරීමට වෙළඳාම් කරනු ලබන මත්ස්‍ය ආහාර සෞඛ්‍ය හා ගුණාත්මකභාවය නියමිත ප්‍රමිතියකට පවත්වාගෙන යන බවට සහතික කිරීමට පියවර ගතයුතු බව දැක්වෙතත් ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හෝ නීති හඳුන්වා දී නොතිබුණු හෙයින් එම කටයුතු පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් හඳුනාගත නොහැකි විය.	එකඟ වේ. නිර්ණායක හා මාර්ගෝපදේශ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෙතින් මේ වන විට ලබාගෙන ඇති අතර ඉදිරි කළමනාකරණ රැස්වීමේ දී අනුමැතිය ලබාගෙන මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි.	මත්ස්‍ය ආහාර සෞඛ්‍ය හා ගුණාත්මකභාවය නියමිත ප්‍රමිතයට පවත්වාගෙන යාම සඳහා නිති හා මාර්ගෝපදේශ හඳුන්වා දිය යුතුය.
	(iii) වගන්ති අංක 7 (ඉ)	භාරයට අයත් තොග වෙළඳසැල් 154 ක් හා සිල්ලර වෙළඳසැල් 128 ක් බදු දීම සඳහා භාර මණ්ඩලය විසින් අනුමත ලිඛිත නිර්ණායක සකස් කළ යුතු වුවත් එබදු නිර්ණායක සකස් නොකර 2011 වර්ෂයේ සිට 2024 දක්වාම බදුදීම සිදුකර තිබුණි.	අලුතින් ලබාදෙනු ලබන වෙළඳසැල් සඳහා නිර්ණායක හඳුන්වා දී ඇත. පැරණි ක්‍රමවේද යටතේ බදු දී වෙළඳසැල් හිස්වන අවස්ථාවල ද නැවත බදු දීම සිදුකරනු ලබන්නේ නව නිර්ණායකවලට යටත්ව ය.	වෙළඳසැල් බදු දීමේ දී ලිඛිත නිර්ණායක සකස් කළ යුතුය.

(iv)	වගන්ති අංක 7 (ග)	භාරයේ දේපළ ආරක්ෂා කරගැනීම සඳහා නඩු පැවරීමට හෝ නඩුවල දී විත්ති වාචික ඉදිරිපත් කිරීමට හැකි බව දක්වා තිබුණ ද 2011 වර්ෂයේ සිට රු.107,264,505 ක බදු දී ඇති වෙළඳසැල් 282ක් සඳහා හිඟ මුදල් අයකර ගැනීම සඳහා නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි ආයතනය තුළ තබා ගැනීමට කටයුතු කර නොතිබූ බැවින් එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු කර නොතිබූ අතර එයට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධව ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	එකග වේ. හිඟ මුදල් අයකර ගැනීමට මේ වන විට කමිටුවක් පත්කර ඇති අතර එහි නිර්දේශ ලබාගෙන හිඟ මුදල් අයකර ගැනීම කඩිනමින් සිදුකරමි. මෙහි මූලික පියවර ලෙස කඩ කුලී ගෙවන ලෙස ලියාපදිංචි තැපෑලෙන් කඩිනමින් ඇනුවත් කිරීමට කටයුතු කරමින් සිටී.	නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි ආයතනය තුළ පවත්වා ගැනීමට හා හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධව පියවර ගත යුතුය.
(v)	වගන්ති අංක 8(අ)	භාරයේ කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය වන ඕනෑම වාර ගණනක් භාරකරුවන්ගේ රැස්වීම් පැවැත්විය හැකිය. ඒ අනුව යටත් පිරිසෙන් මාස 2 කට වරක්වත් එම රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණේ රැස්වීම් වාර 03 ක් පමණි. ඒ අනුව අවම රැස්වීම් ප්‍රමාණයවත් පවත්වා නොතිබුණි.	එකඟ වේ. පසුගිය වර්ෂයේ අමාත්‍යාංශ ලේකම්ධූරය විටින් විට වෙනස්වීම නිසා අවම රැස්වීම් සංඛ්‍යාවක් පවත්වා ගැනීමට නොහැකි විය. එසේ වුව ද මෙම වර්ෂයේ අවම රැස්වීම් සංඛ්‍යාව පවත්වා ගැනීමට සහතික කරනු ලැබේ. 66 වන කළමනාකරණ රැසිවීම ජූලි මස 02 වන දින පැවැත්වීමට නියමිතය.	අවම භාර රැස්වීම් ප්‍රමාණයවත් පැවැත්වීමට කටයුතු කළ යුතුය.
(vi)	වගන්ති අංක 8 (ඊ)	වැටුප්, දීමනා හෝ සම්මත මුදලක් වශයෙන් යම් පාරිශ්‍රමිකයක් ලබාගැනීමට භාරකරුවන්ට හිමිකමක් නොමැති අතර යම් දැරූ වියදමක් පමණක් ප්‍රතිපූර්ණය කරගත හැකිය. එසේ වුවත් ඒ පිළිබඳව නොසලකා භාරකාර මණ්ඩලය සඳහා පළමුවැන්නා ලෙස නම් කළ භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් 14 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් සහ භාර රැස්වීම් වලට සහභාගී වීම වෙනුවෙන් දීමනා ලෙස එකතුව රු.385,000 ක මුදලක් ගෙවා තිබුණි.	භාරකාර මණ්ඩල සභාපතිවරයාගේ ඇතුළු සාමාජිකයන්ට භාරකාර මණ්ඩල රැස්වීමට සහභාගී වීමට දරනු ලබන ඉන්ධන වියදම් ඇතුළු වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් මුදලක් පමණක් ගෙවා ඇත. වැටුප් ගෙවීමක් සිදු කර නොමැත.	වැටුප් දීමනා හෝ සම්මත මුදලක් වශයෙන් භාරකරුවන්ට පාරිශ්‍රමික නොගෙවිය යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කළමනාකරණ භාරයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,063,877 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.8,063,877 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.19,663,536 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ආදායම රු.26,204,530 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	භාරයේ කාර්ය මණ්ඩලය අනුමත වී වසර 7 කට ආසන්න කාලයක් ගත වී තිබුණ ද භාරයේ කළමනාකරු, ගණකාධිකාරි හා අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා 2023 දෙසැම්බර් 31 වන විටත් බඳවා ගැනීම් සඳහා වන පරිපාටිය අනුමත කරවාගෙන බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.	අයහපත් මූල්‍ය තත්වය මත වියදම් කළමනාකරණ කර ගැනීමේ අරමුණින් මෙම තනතුරු අමාත්‍යාංශ නිලධාරීන් මගින් අනාවරණය කරන ලදී. අමාත්‍යාංශ නිලධාරීන් මගින් මෙම තනතුරුවල රාජකාරී ඉටුකර ගැනීම නිසා මූල්‍ය කළමනාකරණය යහපත් මට්ටමක පවත්වාගැනීමට හැකිවිය. ඉදිරියේ දී මෙම තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් බඳවාගැනීමට නියමිතය.	භාරයේ කළමනාකරු ගණකාධිකාරි අභ්‍යන්තර විගණක සඳහා බඳවාගැනීම් සිදුකළ යුතුය
(ආ)	කළමනාකරණ භාරය විසින් තොග වෙළඳසැල් සඳහා වන බදු ගිවිසුම් ප්‍රකාරව මාසික බදු මුදල සෑම වසර 5කට වරක්ම තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත පදනම්ව සංශෝධනය කළ යුතු වුවද 2024 ජනවාරි 01 දින සිට සංශෝධනය විය යුතු බදු මුදල් සංශෝධනය වී තිබුණේ 2024 ජුනි 01 දින සිට විය. ඒ හේතුවෙන් එක් කඩ කාමරයකට රු.15,000 බැගින් කඩ කාමර 154කට මාස 5ක් සඳහා රු.11,550,000 බදු කුලී ආදායමක් අහිමි වී තිබුණි.	තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු වාර්තාව නියමිත දිනට ලබානොදීම නිසා මෙම ගැටලුව ඇතිවිය. 2024 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කළ හැකි පරිදි තක්සේරු වාර්තා ලැබිය යුතු වුව ද එම වාර්තාව අප වෙත ලැබුණේ ප්‍රමාද වී බැවින්, මැයි 17 පැවති කළමනාකරණ භාර රැස්වීමේ අනුමැතිය ලබාගැනීමෙන් පසු ජුනි 01 සිට තක්සේරුව පදනම් කරගෙන ගාස්තු අයකරන ලදී.	අහිමි වූ බදු කුලී ආදායම කඩ හිමිකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.9

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වෙළඳසැල් 128 කින් යුත් සිල්ලර වෙළඳ සංකීර්ණයේ වෙලඳසැල්වලින් 64ක් 2012 වර්ෂයේ දී රු.9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පරිවර්තනය කර තිබුණි. විගණිත දිනය වූ 2025 ජුනි 05 දින වන විට එම පරිවර්තනය කළ තොග වෙළඳසැල් 08 ක් හා සිල්ලර වෙළඳසැල් 03ක් අලෙවි කටයුතු සඳහා යොදා නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.	මේ වන විට ඉන් ඉතුරු වී ඇත්තේ අලෙවිසැල් 11ක් පමණක් වන අතර කළමනාකරණ භාරයේ ඊළඟ රැස්වීමේ දී අනුමැතිය ලැබීමෙන් පසු එම වෙළඳසැල් ලංසු කැඳවා බදු දීමට නියමිතය.	නිෂ්ක්‍රීය අලෙවිසැල් 11 ද අලෙවි කටයුතු සඳහා යොදාගත යුතුය.